# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1637/23 - 2010 ජනවාරි 22 වැනි සිකුරාදා - 2010.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය**

සිවිල් ගුවන් සේවා අධිකාරිය

**196 ගුවන් සංතරණ රෙගුලාසි යටතේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කෙරෙන දැනුම් දීම**

කුලී මෙහෙයුම් ගුවන් ප්‍රවාහන සේවාවන් ( Charter Operations ) හා ගුවනේ දී සිදු කරනු ලබන කාර්යයන් ( Aerial Work Operations) රටතුළ පවත්වාගෙන යාම සඳහා 1955 ගුවන් සංතරණ පනතේ කොන්දේසිවලට අනුකූලව ගුවන් මෙහෙයුම් සහතිකය /කුලී මෙහෙයුම් ගුවන් ප්‍රවාහන සහතිකය ලබා ගැනීම සඳහා අංක 29, ග්‍රේනියර් පාර, කොටා පාර, කොළඹ 08 දරන ස්ථානයේ පිහිටි සීමාසහිත කොස්මොස් එවියේෂන් සර්විසස් (පුද්ගලික) සමාගම විසින් 2009 ඔක්තෝබර් මස 07 දාතමින් ඉල්ලුම් පත්‍රයක් එදිනම මෙම කාර්යාලය වෙත එවනු ලැබ ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම්පතට අනුව සීමාසහිත කොස්මොස් එවියේෂන් සර්විසස් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙසේය.

සජින් ද වාස් ගුණවර්ධන මහතා,
වජිර කාලිංග විජේවර්ධන මහතා,
ටියානා දියන්ති අන්තෝනිස් මහත්මිය.

එකී සමාගමේ යෝජිත ගුවන් මෙහෙයුම් කටයුතු පිළිබඳ පූර්ණ වගකීම කළමණාකාරිත්වය සඳහා වජිර කාලිංග විජේවර්ධන මහතා සීමාසහිත කොස්මොස් එවියේෂන් සර්විසස් (පුද්ගලික) සමාගම විසින් නම් කරනු ලැබ ඇත.

අයදුම්කරුගේ සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ පිටපතක් කොළඹ 03, අංක 64, ගාලු පාරේ, සිවිල් ගුවන් සේවා අධිකාරියේ බිම් මහලේ පිහිටි තාක්ෂණික පුස්තකාලයේ තබා ඇති අතර, ඕනෑම වැඩ කරන දිනක, කාර්යාල වේලාවන් තුළ මහජනතාවට පරීක්ෂාකර බැලීමට හැකි ය.

යෝජිත මෙහෙයුම් සඳහා අවශ්‍ය ගුවන් මෙහෙයුම් සහතික ( Air Operator Certificate ) කුලී මෙහෙයුම් ගුවන් ප්‍රවාහන සහතිකය ( Charter Operator License ) සහ ගුවනේ දී සිදුකරනු ලබන කාර්යයන් ( Aerial Work License ) ඇතුළු අනිකුත් අදාළ අනුමැතීන් ප්‍රදානය කිරීමට ප්‍රථම, ගුවන් සංතරණ රෙගුලාසි මෙන්ම අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ උපදේශ ව්‍යවහාර ( International Standard and Recommended Practices ) සහ මෙම ආයතනය විසින් පිළිගත් ඒ හා සම්බන්ධිත දේශීය අවශ්‍යතාවන්ට අනුව නිරුපද්‍රිත වූත්, ආරක්ෂිත වූත් කාර්යක්ෂම වූත් ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් පැවැත්වීම සඳහා අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය සංස්ථාපිත

ක්‍රියාමාර්ගානුකූලව නිසි පරිදි පරීක්ෂාකර බලා මෙම අයදුම්පත සහතික කිරීමේ වැඩ පිළිවෙල 2010 පෙබරවාරි මස 12 වැනි දිනට පසුව මවිසින් ආරම්භ කිරීමට තීරණය කර ඇති බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉහත පරිච්ඡේදයේ සඳහන් දිනට දින 10 කට ප්‍රථම ඕනෑම පුද්ගලයෙකු හට ඉහත කී අයදුම්පත සම්බන්ධව ලිඛිතව, නිශ්චිත හේතු පදනම් කරගත් කරුණු, ගගන නාවික සංතරණ රෙගුලාසිවලට අනුකූලව මා වෙත සංදේශනය කළ හැකි ය. එවැනි සංදේශනයන්හි අන්තර්ගත සියලු ප්‍රකාශනවල නිරවද්‍යතාව ලිඛිත සාක්ෂි සමග ඉදිරිපත් කළ යුතු ය. එවැනි සංදේශන මා වෙත ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඔහු / ඇය විසින් එහි පිටපතක් අයදුම්කරුට ලැබීමට සැලැස්විය යුතු අතර, එසේ යැවූ බවට සහතිකයක් අදාළ සංදේශනයට අමුණා තිබිය යුතු ය.

පරාක්‍රම දිසානායක,<br>
*වැඩ බලන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්*<br>
සහ ප්‍රධාන විධායක නිලධාරි.

2010 ජනවාරි මස 19 වැනි දින,<br>
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,<br>
අංක 64, ගාලු පාර,<br>
කොළඹ 03.

02-94

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.